# වන්නියලැත්තන්ට

# අභය භූමියක්

එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රකාශයට පත් කල ආදිවාසීන්ගේ අන්තර් ජාතික වසර අරබයා ශ්‍රී ලංකාව එහි ආදිවාසීන් වන වැදි ජනතාව පිළිබඳ නියත ස්ථාවරයක පිහිටා සිටී.

මහවැලි කලාපයේ පදිංචියට කැමති වූ වැදි පවුල් කීපයක් පුනරුත්ථාපනය කැරිණි. ඔවුනට ඉඩම් සහ වෙනත් පහසුකම් සලසා ප්‍රධාන ජාතික ජන ජීවනයට එක්වීමට කටයුතු යෙදිණ.

ශ්‍රී ලංකාවේ අර්ධ හරිත වනාන්තරවල යටත් පිරිසෙයින් වසර 16,000 ක පමණ සිට වාසය කළහයි විශ්වාස කරන වැදි ජනයාගේ කීර්තිය සහ ගෞරවය ආරක්ෂා කිරීමට කොටබකිනිය, කෑරගොඩ, බුලුගහදෙන සහ කන්දෙගන්විල ආදි වැදි ගම්මාන කීපයක් ඇතුළත් වන පරිදි අභයභූමියක් ප්‍රකාශයට පත්කිරීමටත් එය වන්නියලැත්තන්ගේ අභය භූමිය ලෙසින් නම් කිරීමටත් රජය තීරණය කර තිබේ.

වැදි නායක තිසාහාමි සහ ඔහුගේ පවුල නම පාරම්පරික ජන්ම භූමියෙහි දිගට ම වාසය කරති. උද්භිද වර්ගයා සහ සත්ව වර්ගයා සුරැකීමේ දී වැදි ජනතාවගෙන් සිදු වූ මෙහෙය රජය පිළිගෙන තිබේ.

වන්නියෙලැත්තන් ගේ සංස්කෘතිය පැවැතීමට සහ සුරැකීමට "වන්නියලැත්තෝ භාරකාරය" සංවිධානය පිහිටුවීමට රජය පියවර ගත්තේ ය. මෙම භාරකාරයේ කමිටුවට වැදි ජනතාව ගේ නියෝජිතයකු ද පත්ව සිටීම වැදගත් සිද්ධියකි.

රජයේ අදාල නිලධාරීහු, රජයේ නොවන සංවිධාන වල ස්වේච්ඡා සේවකයෝ ද වැදි ජනතාව ගේ ස්වාභාවික වාස භූමිවල ඔවුන් ගේ සංස්කෘතිය නගාසිටුවා එය පොහොසත් කිරීමට සැලසුම් සකස් කරමින් සිටිති.







ආදිවාසීන්ගේ අන්තර්ජාතික වර්ෂය වෙනුවෙන් පාරිසරික හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අනුග්‍රහයෙන් සංවිධානය කළ සජීවී ගුවන් විදුලි වැඩසටහනට වැදි නායක තිසාහාමි සහභාගි වූ අවස්ථාව




වැදි ජනතාවගේ සහභාගිත්වයෙන් පරිසර සම්මන්ත්‍රණ • පාරිසරික හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය ඩී. නේසයියා, පාරිසරික ලේකම් වී. කේ. නානායක්කාර හා වැදි නියෝජිත සුදු බණ්ඩියා යන මහත්වරුන් මෙහි ප්‍රධාන අමුත්තන් විය.



පරිසර සම්මන්ත්‍රණයේ දී වැදි නායකයෙක් සිය අදහස් දක්වමින්. ප්‍රවීන ජනමාධ්‍යවේදී සුනිල් සරත් පෙරේරා මහතා ඔහුට භාෂා පරිවර්තනයෙන් සහාය විය.